# සිතුමිගේ උපන්දින තෑග්ග



නෙතුලි දහම්සා රණසිංහ

# සිතුමිගේ උපන්දින තෑග්ග


## නෙතුලි දහම්සා රණසිංහ

කතෘ


### කතෘගේ වෙනත් කෘති

වලස් පැංචාගේ නුවණ


මහ/මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

3 ශ්‍රේණිය


2026.05.10


ISBN 978-624-211-054-7

# පිදුම

පුරා තෙවසරක කාලයක් මාගේ නැණස විවර කරන්නට උර දුන් මා සදාදරණීය මහාමායා මැණියනි, මාගේ ලේඛන දිවියේ දෙවන එළිදැක්වීම වන මෙම ළමා ප්‍රබන්ධය මෙලෙස ඔබට බැතියෙන් පුදනෙමි..............

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.


ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10



සිතුමි හරිම ගුණ යහපත් කීකරු ළමයෙක්. එයා පවුලේ එකම දරුවා. අම්මායි තාත්තායි එයාට ගොඩක් ආදරෙයි. එයාව රැකගන්නේ පණ වගේ. සිතුමිත් අම්මාටයි තාත්තාටයි පණ වගේ ආදරෙයි. ඒ විතරක් නෙවෙයි, එයාගේ ආච්චිට, සීයාටත් ගොඩාක් ආදරෙයි.

සිතුමිගේ ගුණ යහපත්කම නිසාම හැමෝම සිතුමිට ගොඩාක් ආදරෙයි.

ඉතින් සිතුමි ටිකෙන් ටික ලොකු වුණා. දැන් සිතුමිට වයස අවුරුදු හයයි. එයා දැන් පාසල් යනවා. ඉතින් එයාට යාළුවෝ ගොඩාක් ඉන්නවා. සිතුමි එයාගේ යාළුවෝ හැමෝටම හරිම ආදරෙයි.



එයාලා එක්ක හරිම සතුටින්, විනෝදයෙන් හිටියා. ගුරුවරුත් සිතුමිට හරිම ආදරෙයි.

ඉතින් ඔහොම ඉන්නකොට දවසක් සිතුමිගේ යාළුවෝ එයාලාගේ සුරතලුන් ගැන කතා කරන්න පටන් ගත්තා. හැමෝටම බලු පැටවුන්, පූස් පැටවුන්, ලේන පැටවුන්, ගිරවුන් වගේ සුරතල් සත්තු හිටියා.

ඉතින් සිතුමිට එහෙම සුරතලෙක් හිටියේ නැති නිසා එයා නිශ්ශබ්දව හිටියා. සිතුමිට ගොඩාක් දුක හිතුණා.

සිතුමි එදා ගෙදර ගිහින් අම්මාටයි තාත්තාටයි කිවුවා "අනේ අම්මෙ....තාත්තේ......මගේ යාළුවෝ හැමෝටම සුරතල් සත්තු ඉන්නවා මට විතරක් කවුරුත් නැහැ.

අනේ මට හරිම දුකයි" කියලා. ඉතින් සිතුමි හොඳටම ඇඬුවා.

අම්මායි, තාත්තායි සිතුම්ගේ ඔළුව අතගාලා කිවුවා “අනේ පුතේ දැන් අඬන්නේ නැතුව ඉන්නකෝ.




පුතාට කවුද ඕන කියලා කියන්නකෝ” කියලා. “අනේ අම්මෙ තාත්තේ මට ගිරා පැටියෙක් ගෙනත් දෙන්නකෝ” සිතුම් කිවුවා. “හරි පුතේ අපි ඔයාට ඉක්මණින්ම ගිරා පැටියෙක් ගෙනත් දෙන්නම්” අම්මයි, තාත්තායි කිවුවා.

ඉතින් ඔහොම ඉන්නකොට සිතුමිගේ උපන් දිනයත් ටිකෙන් ටික ළං වුණා. සිතුමිගේ අම්මායි, තාත්තායි සිතුමිට උපන් දින තෑග්ග විදියට ගිරා පැටියෙක් දෙන්න තීරණය කළා.

ඉතින් සිතුමිගේ උපන් දිනය දවස උදා වුණා. එදා ලස්සන ඉරිදා දවසක්. සිතුමි උදෙන්ම අවදි වෙලා දහම් පාසල් ගියා. අම්මායි, තාත්තායි උපන් දින සැමරුමට සියලු දේ සූදානම් කර නගරයට පිටත් වුණා.

නගරයේ පක්ෂීන් වෙළඳාම් කරන තැනක් සොයා ගිය සිතුමිගේ අම්මායි, තාත්තායි ලස්සන ගිරා පැටියෙක් මිල දී ගෙන කූඩුවක දාලා ගෙදර අරන් ගියා.

සිතුමි ගෙදර එනකොට උපන් දින සාදයට හැමෝම ඇවිල්ලා. සිතුමි ගේ ඇතුළට යනකොට ම හැමෝම සිතුමිට සුභ පතන්න පටන් ගත්තා. සිතුමිගේ



අම්මායි, තාත්තායි එක පාරටම ඇවිත් සිතුමිට අපූරු තෑග්ගක් දුන්නා. සිතුමි හරිම පුදුම වුණා. ඒ වගේම සතුටු වුණා. "අනේ, හරිම ලස්සන ගිරා පැටියෙක්. ගොඩාක් ස්තූතියි අම්මේ, තාත්තේ. මම මගේ ගිරා පැටියාව ආදරෙන් බලා ගන්නවා." සිතුමි කිවුවා.

ඉතින් සිතුමි එයාගේ යාළුවෝ හැමෝටම ගෙදරට එන්න කියලා ගිරා පැටියත් එක්ක කතා කළා. ගිරා පැටියත් හරිම අපූරුවට කතා කරනවා.



ඉතින් හැමදාම ඔය විදියට විවේක වෙලාවට සිතුමිගේ යාළුවොත් ඇවිත් ගිරා පැටියත් එක්ක කතා කරන්න පුරුදු වුණා.

ඔහොම ඉන්නකොට එක දවසක් සිතුමි පාසල් ඇරිලා යාළුවොත් එක්ක ගෙදරට එනකොට ගිරා පැටියා කූඩුවේ එල්ලිලා දොර අරින්න හදනවා. එයා වටපිට බල බල කෑ ගහන්න පටන් ගත්තා.

එළියෙ ගිරවුන්, මයිනන්, දෙමළිච්චන් වගේ කුරුල්ලෝ විනෝදයෙන් කිචි බිචි ගාමින් සතුටු සාමිච්චියේ යෙදෙනවා. සිතුමි අම්මාටයි, තාත්තාටයි කතා කළා. "අම්මේ, ගිරා පැටියාට දුක හිතිලා නේද? එයාගේ යාළුවෝ හැමෝම සතුටින් ඉද්දි එයා කූඩුවක හිර වෙලා නේද අම්මේ?

අනේ පවු අහිංසක ගිරා පැටියා. අපි දැන් මොකද කරන්නේ තාත්තේ?" සිතුමි ඇහුවා.


අම්මායි, තාත්තායි සිතුමිගේ ඔළුව අතගෑවා. සිතුමිගේ ඇස් දෙකේ කඳුළු පිරිලා.

“අඬන්න එපා මගේ පුතේ. ඔයාට තේරෙන්නේ නැති නිසානේ ඒ වගේ තෑග්ගක් ඉල්ලුවේ. දැන් මගේ පුතාට තේරෙනවා නේද අපි වගේම හැමෝම නිදහසේ ඉන්න කැමතියි කියලා? කවුරුත් කැමති නෑ හිරවෙලා ඉන්න.” තාත්තා කිවුවා.

“ඔව් මගේ තාත්තේ. මට දැන් තේරෙනවා. අපි එහෙනම් ගිරා පැටියාට යන්න දෙමු ද?” සිතුමි ඇහුවා. “මගේ හොඳ දුව. ඔයාම ඒක තේරුම් ගත්ත එක කොච්චර හොඳ ද?”

එහෙම කියමින් අම්මායි, තාත්තායි සිතුමිගේ ඔළුව අතගෑවා. ඉතින් හැමෝම එකතු වෙලා ගිරා පැටියාව කූඩුවෙන් නිදහස් කළා.

ගිරා පැටියා හරිම සතුටින් ඈතට ගිහින් රවුමක් කැරකිලා ආයෙත් ඇවිත් සිතුමිගේ උරහිසේ වහලා කතා කරලා ඈතට පියාඹලා යන්න ගියා. ඉතින් ගිරා පැටියාගේ සතුට දැකලා හැමෝම සතුටු වුණා.



**-නිමි-**

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර**” ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගා වේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)